**හිමිකම් රක්ෂණ අරමුදල - 2013**

-------------------------------------

හිමිකම් රක්ෂණ අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදයම් හා වියදම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 67 වගන්තිය ප්‍රකාරව පනවන ලද නියෝග වල 41 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.**

--------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 මතය**

------

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට හිමිකම් රක්ෂණ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**3. මූල්‍යසමාලෝචනය**

----------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලය රු.4,054,626 ක අතිරික්තයක් වූ අතර , ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,470,006 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,584,620 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ හිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායම රු.1,191,741 කින් හා ආයෝජන පොළී ආදායම රු.379,431 කින් ඉහළයාම අතිරික්තයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**4.1 කාර්යසාධනය**

-----------------

**4.1.1 අරමුදලේ ක්‍රියාකාරිත්වය**

--------------------------

**(අ)** 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත අනුව ඉඩම් ලියාපදිංචි කිරීමේදී සිදුවන අලාභ සඳහා වන්දි ගෙවීමට මෙම අරමුදල 2010 වර්ෂයේ සිට ක්‍රියාත්මක වුවද සමාලෝචිත වර්ෂය තෙක් එවැනි වන්දියක් නොගෙවීම තුළින් මේ පිළිබඳ පොදු ජනතාව දැනුම්වත් වීම දුර්වල තත්ත්වයක පවතින බව පෙන්නුම් කෙරේ.

**(ආ)** ඉකුත් කාලය තුළ අරමුදලේ කටයුත්ත ලෙස සිදු වී තිබුණේ ලියාපදිංචි ගාස්තු ආදායමෙන් සියයට 40 ක් මාසිකව මාරු කිරීම් ගිණුම්ගත කිරීම, නිලධාරීන්ට දීමනා හා කළමනාකරණ කමිටු දීමනා ගෙවීම් කිරීම වේ. අරමුදලේ සීමිත වූ කාර්යභාරයන් අනිකුත් කාර්යන් මෙන්ම රාජකාරී පැවරීම තුළින් ඉටු කරවා ගත හැකිව තිබියදී ප්‍රධාන ගණකාධිකාරී ඇතුලු නිලධාරීන් 06 දෙනෙකුට මූලික වැටුපෙන් 1/6 ක දීමනාවක් ගෙවා තිබුණි. ඉකුත් කාල පරිච්ඡේදයේදී එසේ කරන ලද ගෙවීම් විස්තර පහත දැක්වේ.

| වර්ෂය | නිලධාරීන් සංඛ්‍යාව | ගෙවන ලද මුදල |
|---|---|---|
| ------ | -------------------- | ------------------ |
| | | රු. |
| 2010 | 6 | 192,419 |
| 2011 | 6 | 280,388 |
| 2012 | 7 | 287,263 |
| 2013 | 9 | 286,848 |

(ඇ) හිමිකම් රක්ෂණ අරමුදල් බැංකු ජංගම ගිණුමේ වර්ෂය පුරා රු.425,000 කට අධික ශේෂයක් පැවති අතර, අරමුදලේ නිශ්චිතව හදුනාගත හැකි ඒකාකාරි වූ වියදම් රටාවක් පවතින බැවින් අතිරික්ත මුදල් අරමුදලේ පරමාර්ථ ඉටු කිරීමට යොදා නොගැනීමෙන් මූල්‍ය කළමනාකරණයේ දුර්වල තත්ත්වයක් පෙන්නුම් කෙරුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

---------------------------------------

**5.1 අයවැය ලේඛනමය පාලනය**

------------------------------

අයවැය ගත අගයන් හා තථ්‍ය අගයන් අතර සියයට 37 සිට සියයට 285 ක විචලනයක් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබූ බව නිරීක්ෂණය විය.